# ජාතික පොලිස් කොමිෂන් සභාව

## தேசிய பொலிஸ் ஆணைக்குழு

# National Police Commission

# වාර්ෂිකවාර්තාව

## ஆண்டறிக்கை

# Annual Report

# 2017

**දැක්ම**

''විශ්වසනීයවූත්, ස්වාධීනවූත්, වෘත්තීයමය පොලිස් සේවාවක් තුළින් සුරක්ෂිත, නිරුපද්‍රිත සහ සාමකාමී සමාජයක් ''

**මෙහෙවර**

''මානව අයිතිවාසිකම්වලට ගරුකරමින් සහ සුරකිමින්, මහජන වගවීම සහතික කරමින්, නීතියේ ආධිපත්‍ය දිරිගන්වන, කාර්යක්‍ෂම, පාරදෘශ්‍ය සහ මහජන අභිලාශයන්ට ප්‍රතිචාර දක්වන සේවාවක් ලෙසට ශ්‍රී ලංකා පොලිසිය පරිණාමනය කිරීම.''

**වටිනාකම්**

ස්වාධීනත්වය

අවංකභාවය

වගවීම

සහයෝගීතාව

අඛණ්ඩ ඉගෙනුම

නිර්මාණශීලීත්වය

# පටුන


පිටු අංකය

1. පූර්විකාව 3

2. කොමිෂන් සභාවේ සංයුතිය 4

3. කොමිෂන් සභාවේ බලතල හා කාර්යභාරය 5

4. කොමිෂන් සභාව තුල ස්ථාපිත කර ඇති අංශ,ඒකක සහ එමඟින් ඉටුකර ඇති කාර්යයන් 6

4.1 පරිපාලන,පරියේෂණ සහ සංවර්ධන අංශය 7

4.2 මහජන පැමිණිලි විමර්ශන අංශය 17

4.3 ආයතන හා විනය කටයුතු අංශය 19

4.4 ප්‍රතිපත්ති, නීති හා අභියාචනා අංශය 22

4.5 මූල්‍ය අංශය 23

❖ ඇමුණුම 01 - ජාතික පොලිස් කොමිෂන් සභාවේ පළාත් අධ්‍යක්ෂ කාර්යාල වල ලිපිනයන් හා දුරකථන අංක 31

## 1. පූර්විකාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය ප්‍රකාරව 2015 වර්ෂයේ ඔක්තෝබර් 14 වැනි දින අභිනවයෙන් සංස්ථාපනය කොට වැඩ කටයුතු ආරම්භ කරන ලද ජාතික පොලිස් කොමිෂන් සභාව 2017 වනවිට එහි දෙවැනි වර්ෂය නිම කර ඇත. 2016 වර්ෂයේ දී පොලිස් කොමිෂන් සභාව විසින් භෞතික හා භෞතික නොවන සම්පත් සම්බන්ධයෙන් පැන නැගුණු බාධක සියල්ල ජයගනිමින් ප්‍රගතිගාමී පියවර රැසක් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව පොලිස් කොමිෂන් සභාව විසින් එහි කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් හා වෙනත් සම්පත් යෙදවීම් සඳහා අවශ්‍ය ආයතනික ව්‍යුහයන් ස්ථාපිත කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

ජාතික පොලිස් කොමිෂන් සභාවට ලැබී ඇති බලතල ක්‍රියාත්මක කරනු වස් පොලිස් කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා පොලීසිය, නීතිය හා සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය සමග නීති බලාත්මක කිරීම සම්බන්ධයෙන් ඍජුව හා වක්‍රාකාරයෙන් සම්බන්ධවන වෙනත් විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සහභාගීත්වයෙන් පාර්ශවකරුවන්ගේ ජාලයක් ස්ථාපිත කරන ලදි. මහජනතාවගේ සහ වෙනත් පාර්ශවකරුවන්ගේ විශ්වාසය දිනා ගැනීම සඳහා සැලසුම් කරන ලද විවිධ ක්‍රියාමාර්ග සහ මැදිහත්වීම් පිළිබඳ තොරතුරු සැපයීම සඳහා වැඩි බරක් තැබූ අතර මහජනතාවට ගුණාත්මක හා කාර්යක්ෂම පොලිස් සේවාවක් ලබා දීම සඳහා ගනු ලැබූ පියවර එනම් පොලිසිය හා මහජන සම්බන්ධතා වැඩි දියුණු කිරීම, මනා විනිවිදභාවයක් උදෙසා මහජන අදහස් විමසීම සහ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ලබා ගැනීම ආදිය මෙම සැලසුම්වලට ඇතුලත් විය.

මහජනතාවගේ යහපත උදෙසා මහජන හිතකාමී පොලිස් සේවයක් නිර්මාණය කිරීමේ අරමුණින් සමාලෝචිත 2017 වර්ෂය තුල කොමිෂන් සභාව විසින් ගනු ලැබූ පියවර සහ එහි කාර්ය සාධනය පිළිබඳ තොරතුරු 2017 වාර්ෂික වාර්තාව තුලින් ඉදිරිපත් කෙරේ. ඒ අනුව යහපාලන මූලධර්ම සාක්ෂාත් කර ගැනීම තහවුරු කිරීම සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාව එහි පුළුල් ඉලක්ක සහ අරමුණු ඉදිරිපත් කරන ලදි. මෙහිදී ජාතික පොලිස් කොමිෂන් සභාවේ සහ ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රතිරූපය හා විශ්වසනීයත්වය ක්‍රම ක්‍රමයෙන් වැඩි දියුණු කරමින් සේවයට කැප වූ කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ, ශ්‍රී ලංකා පොලීසියේ, ජනමාධ්‍යවල, මහජනතාවගේ සහ ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සහයෝගය තුලින් මෙරට තුල මහජන හිතකාමී පොලිස් සේවාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබීය.

## 2. කොමිෂන් සභාවේ සංයුතිය

**සභාපති:**

නීතිඥ

**පී.එච්. මනතුංග මහතා**

**කොමිෂන් සභාවේ සාමාජිකයන්:**

**1. මහාචාර්ය එස්.ටී. හෙට්ටිගේ**

සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්ය

**2.** නීතිඥ

**සාවිත්‍රි ඩී විජේසේකර මිය**

**3. බී.ඒ. ජෙයනාදන් මහතා**

හිටපු නියෝජ්‍ය පොලිස්පති

**4. වයි.එල්.එම්. සවාහිර් මහතා**

හිටපු තානාපති,

ශ්‍රී ලංකා විදේශ සේවය

**5. තිලක් කොල්ලුරේ මහතා**

හිටපු කැබිනට් අමාත්‍යාංශ ලේකම්,

ශ්‍රී ලංකා පරිපාලන සේවය

**6. ෆ්‍රැන්ක් ද සිල්වා මහතා**

හිටපු පොලිස්පති

**ලේකම්:**

**ඩී.එම්.එස්. දිසානායක මහතා**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණිය

## 3. කොමිෂන් සභාවේ බලතල හා කාර්යභාරය

**19 වැනි ආණ්ඩුම ව්‍යවස්ථා සංශෝධනයෙහි 155 ජී (1) (අ) වගන්තිය ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල පහත පරිදි වේ:**

1. පොලිස්පති හැර අනෙකුත් පොලිස් නිලධාරීන් පත්කිරීම, උසස් කිරීම, මාරු කිරීම, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම.
2. පොලිස් නිලධාරියකුට හෝ පොලිස් සේවයට එරෙහිව මහජනයා විසින් හෝ අතෘප්තියට පත් ඕනෑම පුද්ගලයකු විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාර ගැනීම හා ඒවා විමර්ශනය කිරීම සඳහාත් නීති ප්‍රකාරව ඒවාට විසඳුම් ලබා දීම සඳහාත් පොලිස් කොමිෂන් සභාව විසින් ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම.

පහත දැක්වෙන කරුණු ඇතුළුව පොලිස් නිලධාරීන්ගේ සියලුම කටයුතු සම්බන්ධයෙන් කොමිෂන් සභාව පොලිස්පතිවරයා සමග සාකච්ඡා කර තීරණවලට එළඹීමට කටයුතු කළ යුතුය:-

(අ) බඳවා ගැනීම, උසස් කිරීම සහ ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබන ඕනෑම ප්‍රතිපත්තියකට යටත්ව බඳවා ගැනීමේ, උසස් කිරීමේ සහ මාරු කිරීමේ පටිපාටි සකස් කිරීම.

(ආ) පුහුණු කිරීම සහ පොලිස් සේවයේ කාර්යක්ෂමතාව සහ ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම

(ඇ) ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමෙන් භාවිත කළ යුතු අවි ආයුධ, පතරොම් හා වෙනත් අවශ්‍ය උපකරණවල ස්වභාවය සහ වර්ගය තීරණය කිරීම; සහ

(ඈ) හැසිරීම, හා විනය කාර්ය පටිපාටි සංග්‍රහයන් සකස් කිරීම.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි උපලේඛනයේ ඇතුලත් I වැනි ලැයිස්තුවේ I පරිශිෂ්ටය යටතේ පැවරී ඇති සියළුම බලතල කොමිෂන් සභාව විසින් ක්‍රියාවට නැංවිය යුතු අතර එහි කාර්යභාරයන් හා රාජකාරී ඉටු කළ යුතුය.

## 4. කොමිෂන් සභාව තුළ ස්ථාපිත කර ඇති අංශ සහ ඒකක

ඉහත සඳහන් බලතල හා අදාළ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ක්‍රියාකාරී අංශ සහ ඒකක පිහිටුවා ඇත. මේ එක් එක් අංශ සහ ඒකක වෙත වෙන වෙනම කාර්යභාරයන් පැවරී ඇත.

1. පරිපාලන, පර්යේෂණ සහ සංවර්ධන අංශය
2. මහජන පැමිණිලි විමර්ශන අංශය
3. ආයතන සහ විනය කටයුතු පිළිබඳ අංශය
4. ප්‍රතිපත්ති, නීති සහ අභියාචනා අංශය
5. මූල්‍ය අංශය

## 4.1. ජාතික පොලිස් කොමිෂන් සභාවේ පරිපාලන, පර්යේෂණ සහ සංවර්ධන සහ බාහිර ප්‍රවේශ කටයුතු

ජාතික පොලිස් කොමිෂන් සභාවේ ප්‍රමුඛ සේවාවන් සහ පරිපාලන, පර්යේෂණ සංවර්ධන සහ බාහිර ප්‍රවේශ කාර්යයන් යටතේ ආයතනික ධාරිතාවන් සංවර්ධන යන ද්විත්ව කාර්යයන් සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාව කාර්ය මණ්ඩල පත් කරයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් විවිධ වූ දීප ව්‍යාප්ත සේවාවන්ගෙන් සහ ඒකාබද්ධ සේවාවන්ගෙන් සිවිල් සේවයේ රාජ්‍ය නිලධාරීන් කොමිෂන් සභාවට බඳවා ගනු ලබයි. ඊට අමතරව මාධ්‍ය නිලධාරී, දත්ත සටහන් ක්‍රියාකරුවන් වැනි අභ්‍යන්තර වශයෙන් බඳවා ගත් කාර්ය මණ්ඩලයක් ද ඇත. සැමවිටම ස්වාධීන සහ අපක්ෂපාතී තීරණ ගැනීමේදී ජාතික පොලිස් කොමිෂන් සභාව තුළ අවස්ථානුකූලව පැන නගින අවශ්‍යතා සළකා බලා රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ විධිවිධාන යටතේ කොන්ත්‍රාත් පදනම මත අත්දැකීම් සහිත විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් ද බඳවා ගනු ලැබීය.

### 4.1.1. අරමුණ ඉටු කිරීම සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාව සුදුසු වන බව සහ විධි නියෝග ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති බවට සහතික කිරීම.

- **කාර්යක්ෂම අධීක්ෂන ආයතනයක් ලෙස ජාතික පොලිස කොමිෂන් සභාව ප්‍රතිව්‍යුහගත කිරීම.**

ජාතික පොලිස් කොමිෂන් සභාව ප්‍රතිව්‍යුහගත කරන ලෙසට ව්‍යවස්ථා සභාව මඟින් කරන ලද ඉල්ලීමට අනුව ආයතනික අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ අංශ ප්‍රධානීන් සමඟ සාකච්ජා පවත්වනු ලැබීය. මෙහිදී අවශ්‍ය වන කාර්ය මණ්ඩල පිළිබඳ ප්‍රතිශෝධනයන් සහ ආයතනික වශයෙන් කළයුතු වෙනස්කම් පිළිබඳ තීරණය කරනු ලැබීය.

- **කොමිෂන් සභාවේ විශේෂ විමර්ශන ඒකකය පිහිටුවීම.**

ශ්‍රී ලංකාව සඳහා වන ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මේ නිර්දේශ සහ විවිධ පාර්ශවකරුවන්ගේ ඉල්ලීම් සළකාබැලීමෙන් අනතුරුව වෘත්තීය සිවිල් නිලධාරියකුගේ ප්‍රධානත්වයෙන් විශේෂ විමර්ශන ඒකකයක් පිහිටුවීමට තීරණය කරන ලදි.

මෙම නව ඒකකයේ කාර්යභාරය වනුයේ පොලිස් නිලධාරීන් විසින් සිදු කරනු ලබන වධ හිංසා පැමිණවීම් වැනි මහජන පැමිණිලි කොමිෂන් සභාවේ විනය පාලනයට යටත්වන නිලධාරීන් විසින් පොලිස් නිලධාරීන්ට එරෙහිව කොමිෂන් සභාවට කරනු ලබන පැමිණිලි පිළිබඳ විමර්ශන පැවැත්වීමයි.

කොමිෂන් සභාව විසින් බලය පවරා ඇති පරිදි පොලිස් නිලධාරීන්ට එරෙහිව මහජනයා විසින් කරනු ලබන යම් යම් චෝදනා පිළිබඳව කාර්ය මණ්ඩලය විමර්ශන පවත්වනු ලබයි. එසේම කොමිෂන් සභාව විසින් ඍජු ලෙසම විනය පාලනය කරනු ලබන පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් වන අවකල් ක්‍රියා පිළිබඳව ද විමර්ශන පවත්වනු ලබන අතර පොලිස් නිලධාරීන් විසින් පොලිස් නිලධාරීන්ට එරෙහිව කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන් ද විමර්ශන සිදු කරනු ලැබේ.

- **වෘත්තීයමය කාර්ය මණ්ඩල බඳවා ගැනීම.**

කොමිෂන් සභාවේ කාර්යභාරය පුළුල් වනවාත් සමඟම වෘත්තීයමය වශයෙන් සහ විධායක මට්ටමේ කාර්ය මණ්ඩල බඳවා ගැනීමට පියවර ගෙන ඇත. ඒ අනුව පහත සඳහන් ප්‍රධාන තනතුර සඳහා කාර්ය මණ්ඩල පත් කර ඇත.

- පරිපාලන පර්යේෂන සහ සංවර්ධන රාජකාරී ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම්වරියක බඳවා ගැනීම.
- පරිපාලන, අභියාචන ආයතනික සහ විනය රාජකාරී ඉටු කිරීම සඳහා අංශ ප්‍රධානීන්ට සහාය වනු පිණිස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහකාර ලේකම්වරුන් සහ සහකාර අධ්‍යක්ෂවරුන් ස්ථිර පදනම මත බඳවාගෙන ගැනීම.
- කොමිෂන් සභාවේ කාර්යයන් සංවිධානය කිරීම සඳහා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ සහ සභාපතිවරයාගේ සම්බන්ධීකරණය යටතේ කොමිෂන් සභාවේ තීරණ නිසි පරිදි වාර්තා කිරීම සඳහා කොමිෂන් සභා ලේකම් පත් කිරීම.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම් අභියාචනාධිකරණයේ ගොනු කර ඇති රිට් පෙත්සම් හා සම්බන්ධව රාජකාරී මෙන්ම පවතින අනු නීති සමාලෝචනය කිරීම, අභියාචනා විනිශ්චය අධිකාරයේ පවතින සංකීර්ණ නඩු සම්බන්ධයෙන් පෙනී සිටීම, ප්‍රතිපත්තිමය සහ නීතිමය කරුණු පිළිබඳව කොමිෂන් සභාවට උපදෙස් ලබාදීම වැනි රාජකාරී ඉටු කිරීම සඳහා නීති නිලධාරී පත් කිරීම.

- **ගොඩගැසී ඇති ගොනුවල කටයුතු අවසන් කිරීම සඳහා අත්දැකීම්ලත් රාජ්‍ය නිලධාරින් බඳවා ගැනීම.**

  2015 වර්ෂයේ සම්මත වූ 19 වන සංශෝධනයෙන් පසුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත බාරදෙනු ලැබූ ගොනු විශාල ප්‍රමාණයක් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති, නීති සහ අභියාචනා අංශයේ අංශ ප්‍රධානීන්ට සහාය වනු පිනිස කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් කිහිපදෙනෙකු කැලි ක්‍රමය යටතේ වේතන ගෙවීමේ පදනම මත බඳවා ගනු ලැබීය.

## 4.1.2. කාර්යක්ෂම සේවා සම්පාදනයක් සඳහා මානව සම්පත් කළමනාකරණය

කොමිෂන් සභාවේ කාර්යභාරය පුළුල් වීමත් සමඟ ඉටු කිරීමට ඇති වැඩ ප්‍රමාණය අධිකවීම නිසා අමතර කාර්යමණ්ඩලවල අවශ්‍යතාවයක් පැන නැගුනි. මෙම සේවක සංඛ්‍යා අවශ්‍යතා සපුරා ගැනීම උදෙසා කළමනාරකණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ දිගින් දිගටම සාකච්ජා කරනු ලැබීය.

වර්තමානයේ පවතින පුරප්පාඩු වගුව 1 මගින් දක්වා ඇත.

වගුව 1 : ජාතික පොලිස් කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යා තොරතුරු

වගුව 1

| අනු අංකය | තනතුර | සේවාව | අනුමත කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1 | ලේකම් | ශ්‍රී.ලං.ප.සේ.(විශේෂ පංතිය) | 01 | 01 |
| 2 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. I | 01 | _ |
| 3 | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. I | 03 | 01 |
| 4 | අතිරේක ලේකම් | කොන්ත්‍රාත් පදනම | 01 | _ |
| 5 | පළාත් අධ්‍යක්ෂ | කොන්ත්‍රාත් පදනම | 09 | _ |
| 6 | අධ්‍යක්ෂ | කොන්ත්‍රාත් පදනම | 01 | |
| 7 | ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග.සේ. III | 01 | 01 |
| 8 | සහකාර/ නියෝජ්‍ය ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. III | 09 | 07 |
| 9 | සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මාධ්‍ය හා ප්‍රලේඛණ) | ශ්‍රී.ලං.ප.සේ. III | 01 | 01 |
| 10 | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. III | 01 | _ |
| 11 | නීති නිලධාරි | දෙපාර්තමේන්තුගත | 01 | _ |
| 12 | කමිටු ලේකම් | කොන්ත්‍රාත් පදනම | 01 | _ |
| 13 | පරිපාලන නිලධාරී | කළමනාකරණ සහකාර අධි ශ්‍රේණිය | 01 | 01 |
| 14 | භාෂා පරිවර්තක(සිංහල/ ඉංග්‍රීසි) | ශ්‍රී ලංකා භාෂා පරිවර්තක සේවය | 01 | 01 |
| 15 | භාෂා පරිවර්තක (සිංහල/ දෙමළ) | ශ්‍රී ලංකා භාෂා පරිවර්තක සේවය | 01 | 01 |
| 16 | තොරතුරු තාක්ෂණ නිලධාරී | තොරතුරු තාක්ෂණ සේවය | 01 | _ |
| 17 | මාධ්‍ය නිලධාරි | දෙපාර්තමේන්තුගත | 01 | _ |
| 18 | විමර්ශන නිලධාරි | දෙපාර්තමේන්තුගත | 16 | |
| 19 | කළමනාකරණ සහකාර | කළමනාකරණ සහකාර සේවය | 40 | |
| 20 | තොරතුරු තාක්ෂණ සහකාර | තොරතුරු තාක්ෂණ සේවය | 05 | |
| 21 | දත්ත සටහන් ක්‍රියාකරු | දෙපාර්තමේන්තුගත | 01 | _ |
| 22 | රියදුරු | රියදුරු සේවය | 04 | _ |
| 23 | ත්‍රිරෝද රථ රියදුරු | දෙපාර්තමේන්තුගත | 01 | _ |

| | | | | |
|---|---|---|---|---|
| 24 | කාර්යාල කාර්ය සහායක | කාර්යාල කාර්ය සහායක සේවය | 13 | |
| **එකතුව** | | | **117** | **14** |

- **ජාතික පොලිස් කොමිෂන්සභාවේ කාර්ය මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම් සංවිධාන කිරීම.**

එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගනිමින් ඔවුන් විසින් පත්කරනු ලැබූ ස්වාධීන උපදේශක වරයෙකු විසින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ රැකියා විස්තර නැවත ඇගයීමකට ලක් කිරීම සිදු කරනු ලැබීය.

- **කාර්ය මණ්ඩල පුහුණුව සඳහා පුහුණු අවශ්‍යතා සහ තක්සේරුවක් සිදු කිරීම.**

ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැංවීම සඳහා වන උත්ප්‍රේරක සහාය නම් විදේශ ආධාර ව්‍යාපෘතිය යටතේ මුලින් ලැබුණු මුල්‍යාධාර කොටසේදී පුහුණු අවශ්‍යතා තක්සේරුවක් පිළිබඳව සාකච්ජා කරනු ලැබීය. ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ ශක්‍යතාවයන් වැඩිදියුණු කිරීම සහ මහජන සේවා සැපයීමේදී ආයතනය වඩා සඵලදායී ලෙස දියුණු කිරීම මෙම ක්‍රියාකාරකමේ ඉලක්කය විය.

- කාර්ය මණ්ඩලයේ පුහුණුව සහ දැනුවත්භාවය වර්ධනය කිරිම

**I.** **කණ්ඩායම් ගොඩනැංවීම, නායකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රචලිත කිරීම පිළිබඳ පුහුණුව**

ජාතික පොලිස් කොමිෂන්සභාවේ ප්‍රධාන කාර්යාලයේ සහ පළාත් කාර්යාලවල නිලධාරින් 74 දෙනෙකු සඳහා වස්කඩුව සිට්‍රස් හෝටලයේදී 2017.05.26,27 දක්වා නේවාසික පුහුණු වැඩමුළුවක් පවත්වනු ලැබීය. වැඩමුළුවේ අන්තර්ගතය වූයේ නායකත්වය, සංවර්ධනය, කණ්ඩායම් ගොඩනැංවීම, යහපාලනය වැනි විෂයයන්ය. මෙම වැඩමුළුව සඳහා මූල්‍ය අනුග්‍රහය සපයනු ලැබුවේ USAID ආයතනය විසිනි.

**II.** **ජාතික පොලිස් කොමිෂන්සභාවේ සෑම මට්ටමක කාර්ය මණ්ඩලවල මූලික හැකියාවක් වැඩිදියුණු කිරීම සඳහා එක්සත් ජාතනීගේ සංවර්ධන අරමුදල සමඟ පුහුණු සැලැස්මක් සකස් කිරීම.**

ශ්‍රී ලංකාවේ සාමය ගොඩ නැංවීම සඳහා වන උත්ප්‍රේරක සහාය ව්‍යාපෘතිය යටතේ දේශීය පුහුණු ආයතන මඟින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ පතිපාදනවල මුල් කොටසින් මුදල් ලබා ගැනීමට හැකියාව ලැබුණි.

කාර්ය වපසරිය තුල විශේෂිත පුහුණු පාඨමාලා ලෙස උසස් පුහුණු සැසි දේශීය සහ විදේශීය ආයතනගතව සිදු කිරීමට සැලසුම් කරන ලදි.

**III. ජාතික පොලිස් කොමිෂන්සභාවේ ප්‍රමුඛ සේවා සම්පාදනය සඳහා වන හැකියා වැඩිදියුණු කිරීම වෙනුවෙන් ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද ඒජන්සිය (USAID) සමඟ වූ පුහුණු සැලැස්ම.**

ජාතික පොලිස් කොමිෂන් සභාවේ ප්‍රමුඛ සේවා සම්පාදනය සඳහා තෝරාගත් කාර්ය මණ්ඩල සාමාජිකයින් පුහුණු කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් සම්බන්ධීකරණය කරනු ලැබූ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනද ඒජන්සියේ SDGAP ව්‍යාපෘතිය මඟින් මූල්‍ය ප්‍රතිපාදන සහතික විය. ප්‍රායෝගික පොලිස් පරිපාලනය සහ තොරතුරු දැන ගැනීමේ අයිතිය මෙම පුහුණුවලදී අවධානය යොමු විය.

## 4.1.3 කාර්යක්ෂම සේවා සම්පාදනය සඳහා සංවිධාන ශක්‍යතා ශක්තිමත් කිරීම.

- අන්තර්ජාතික සංවර්ධන ආයතන සමඟ සහයෝගීතා සහ හවුල්කාරිත්වය.

ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැංවීම සඳහා වූ ප්‍රමුඛතා සැලැස්ම හඳුන්වාදීමත් සමඟම අන්තර්ජාතික හවුල්කාරී පාර්ශවයන් විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව සඳහා තාක්ෂණික සහ මූල්‍යමය සහාය පළ කරනු ලැබීය. 2015/2016 වර්ෂවල සංකල්ප ගත කරනුලැබූ ව්‍යපෘති තුනක් 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබීය.

අ. යුරෝපීය සංගමයේ සාමය ගොඩනැංවීම සඳහා වන උත්ප්‍රේරක සහාය ව්‍යාපෘතිය

ආ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමය ගොඩනැංවීමේ අරමුදල මඟින් ප්‍රතිපාදන සපයන සාමය ගොඩනැංවීම ඉදිරියට ගෙනයාම සඳහා වන ප්‍රතිසංස්කරණ සිදු කිරීමට ධාරිතා ශක්තිමත් කිරීමට සහාය වීම සහ ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය ව්‍යාපෘතිය

ඇ. ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද ඒජන්සිය මඟින් ප්‍රතිපාදන සපයන SDGAPව්‍යාපෘතිය

**2017 වර්ෂය තුළ සංවර්ධන හවුල්කාර පාර්ශව සමඟ පහත සඳහන් සාකච්ඡා පවත්වනු ලැබීය.**

- ජාතික පොලිස් කොමිෂන් සභාවේ ධාරිතාවන් සංවර්ධනය කිරීම සඳහා ලබාදිය හැකි තාක්ෂණික සහාය පිළිබඳ ජායත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද ඒජන්සියේ නියෝජිතවරුන් සමඟ 2017.03.06 වන දින සාකච්ජාවක් පවත්නු ලැබීය.
- ආසියානු පදනම,සංක්‍රමණිකයන් සඳහා වන ජාත්‍යන්තර සංවිධානය , එකස්ත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඇමරිකා එක්සත් ජනපද ඒජන්සිය යන ආයතනවල නියෝජිතවරුන්ගේ සහභාගීත්වයෙන් 2017.06.23 වන දින සාකච්ජාවක් පවත්වනු ලැබූ අතර එහිදි පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ලැබීය.

i. ජාතික පොලිස් කොමිෂන් සභාවේ සේවාවන් කාර්යක්ෂමවත් විනිවිධභාවයෙන් සහ වගකීමෙන් යුක්තව ජනතාවට ලබාදීමේ අරමුණු ඇතිව කොමිෂන් සභාවේ බලතල කාර්යභාරය සහ අරමුණු පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම.

ii. මහනජන පැමිණිලි විමර්ශනය වෘත්තීය මට්ටමකින් සහ ඵලදායීව ඉටු කිරීම සඳහා එම අංශයේ ධාරිතාවන් සංවර්ධනය කිරීම.

iii. කොමිෂන් සභාවේ ප්‍රධාන කර්යාලය සහ පළාත් කාර්යාල ජාලගත කරමින් පළාත් කාර්යාල ශක්තිමත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණය මත පදනම ්වූ මහජන පැමිණිලි කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.

iv. තොරතුරු දැන ගැනීමේ පනත පිළිබඳව දැනුවත් කිරීම සඳහා කර්ය මණ්ඩලය සඳහා පුහුණු සැසියක් සංවිධානය කිරීම.

v. ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා කාර්යාංශය ශක්තිමත් කිරීම සඳහා සංවිධාන විශ්ලේෂණයක් කිරීම සහ දුර්වලතා සහ සංවර්ධනය කළ යුතු අංශ හඳුනා ගැනීම.

- **ප්‍රධාන කාර්යාංශවල ධාරිතාවන් වර්ධනය කිරීමට භෞතික සම්පත් අත්පත් කර ගැනීම.**

වියදම් අධික මෙන්ම විශාල අඩුපාඩු ලෙස පැවති තොරතුරු සන්නිවේදන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට අවශ්‍යවන භෞතික සම්පත් අත්පත් කර ගැනීම උදෙසා අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද ඒජන්සිය (USAID) එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNDP) සහ ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධානය (IOM) වැනි සංවර්ධන සහායක ආයතන සමඟ සාකච්ජා පවත්වනු ලැබීය. සාමය ගොඩනැංවීම ඉදිරියට ගෙනයාම සඳහා වන ප්‍රතිසංස්කරණ සිදු කිරීමට ධාරිතා ශක්තිමත් කිරිමට සහාය වීම සහ ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්ති ක්‍රියවාලිය පිළිබඳ ව්‍යාපෘතිය යටතේ ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධානය විසින් සම්පාදනය කරනු ලබන පළාත් කාර්යාල ජාලගත කිරීමේ මහජන පැමිණිලි කළමනාකරණ පද්ධති (PCMS) සඳහා දෘඩාංග ලබා ගැනීම, නිශ්චල ඡායාරූප ලබාගත හැකි කැමරාවක්, වීඩියෝ කැමරාවක් සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිෂ්පාදන නිර්මාණයට අදාල වන මෘදුකාංග ආදී මාධ්‍ය උපකරණ අත්පත් කර ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල සමඟ සාකච්ජා පවත්වනු ලැබීය.

- **තාක්ෂණික ධාරිතාවයන් වර්ධනය කිරීම.**

කොමිෂන් සභාවේ මහජන පැමිණිලි අංශයේ කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සහ පැමිණිලි විමර්ශන ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදු කිරීම සඳහා පහසුකම් ලබා ගැනීම සඳහා අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන එකසත් ජනපද ඒජන්සිය (USAID) සංක්‍රමණිකයන් සඳහා වන ජාත්‍යන්තරසංවිධානය (IOM) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නියෝජිතයන් සමඟ වට මේස සාකච්ජාවක් පවත්වනු ලැබීය. මෙම සැසිවාරයේදී

තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමටත් කාර්යංශ සඳහා පහසුකම් හා උපකරණ ලබාදීමටත් අවධානය යොමු විය.

**4.1.4 පොලිස් පැමිණිලි ක්‍රමය පිළිබඳ ප්‍රජාව තුළ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම.**

- **පාර්ශවකරුවන්ගේ අදහස් විමසීමේ සැසි පැවැත්වීම.**

**විද්වත් සහ මහජන අදහස් විමසීම්**

ජාතික පොලිස් කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව මහජනතා දැනුවත් කිරීම සහ පොලිස් සේවාවේ සේවා තත්ත්වයන් වැඩි දියුණු කිරිමේ අරමුණින් දිවයින පුරා පැවැත්වීමට සැලැසුම් කළ විද්වත් අදහස් සහ මහජන අදහස් විමසීමේ සැසිවාර 2017 වර්ෂයේදී ආරම්භ කිරීමට හැකි විය.

මෙහි ප්‍රථම මහජන අදහස් විමසීමේ සැසිවාරය 2017.12.09 වන දින හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කෙන්ද්‍ර කරගෙන පවත්වනු ලැබූ අතර ඒ සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදෙනු ලැබුවේ එක්සත් ජාතින්ගේ සංවර්ධන අරමුදල මඟිනි. මෙම සැසිවාරය සඳහා සියළුම ග්‍රාම නිලධාරි වසම් නියෝජනය කරමින් ප්‍රජා නායකයින් 67 දෙනෙකුට ආරාධනා කරනු ලැබූ අතර නීති බලාත්මක කිරීම සහ පොලිස් සේවාවේ තතත්වය පිළිබඳ ඔවුනගේ අදහස් තේමා 05 ක් යටතේ ලබාගනු ලැබීය. ඊට අමතරව ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන් පිළිබඳ ඔවුන් දැනුවත් කරනු ලැබූ අතර එදින පස්වරු 2.00 සිට 5.00 වනතුරු සාර්ථකව මෙම වැඩමුළුව පවත්වනු ලැබීය

**<u>හොරණ පැවති ප්‍රථම මහජන අදහස් වීමසීමේ අවස්ථා කිහිපයක්</u>**




**මහාචාර්ය සිරි හෙට්ටිගේ මහතා සභාව අමතමින්**



**සැසිය අතරතුර කණ්ඩායම් සාකච්ජා පවත්වමින්**



**කණ්ඩායම් සාකච්ජා පවත්වමින්**

<u>මහජන අදහස් විමසීමේ තේමා 05</u>

i. අපරාධ හා අපරාධ නිවාරණය
ii. පොලීසිය සහ මහජනතාව අතර සම්බන්ධය
iii. නීති විරෝධී මත්පැන් සහ මත් ද්‍රව්‍ය , නිෂ්පාදනය,ප්‍රවාහනය සහ වෙළදාම
iv. කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි අපරාධ සහ ගෘහස්ථ හිංසනය
v. පාරිසරික වශයෙන් සිදුවන අපරාධ සහ එක් එක් ප්‍රදේශයට ආවේණික ගැටලු

**ජාතික පොලිස් කොමිෂන් සභාවේ හඹිර ප්‍රවේශ ශකාතාවයන් වැඩි දියුණු කිරීම.**

- **ජාතික පොලිස් කොමිෂන් සභාව සඳහා නව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම.**

"සාමය ගොඩනැංවීම ඉදිරියට ගෙනයාම සඳහා වන ප්‍රතිසංස්කරණ සිදු කිරීමට ධාරිතා ශක්තිමත් කිරීමට සහාය වීම සහ ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්ති ක්‍රියවාලිය පිළිබඳ ව්‍යාපෘතිය" යටතේ මහජන පැමිණිලි ඉලෙක්ට්‍රොනික මාදිලියෙන් සිදු කිරීමේ පහසුකම් සහිතව නව වෙබ් අඩවියක් ජාතික පොලිස් කොමිෂන්සභාව සඳහා නිර්මාණය කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් ලාබදෙනු ලැබීය.

- **ජාතිකපොලිස්කොමිෂන්සභාවේසේවාපිළිබඳප්‍රචාරක ව්‍යාපාරය**

එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ සහයෝගය ඇතිව මහජන පැමිණිලි විමර්ශන ක්‍රියාවලියපිළිබඳ ප්‍රචාර ව්‍යාපාරයක් සඳහා සාකච්ජා පවත්වනු ලැබීය. සියලු ජනවාර්ගිකත්වයන් ඉලක්ක කරගෙන තොරතුරු පත්‍රිකා, විස්තර පත්‍රිකා, කෙටි වීඩියෝ දර්ශන සහ වෙනත සන්නිවේදන උපක්‍රම මඟින් මෙය සිදු කිරීම සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට සාකච්ජා පවත්වා ඇත.

## 4.1.5. ගුණාත්මක පොලිස් සේවා සම්පාදනයක් සඳහා සේවාවල තත්ත්වයන් වැඩිදියුණු කිරීම.

- **<u>පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය වැඩි දියුණු කිරිම</u>**

ළමා හා කාන්තා කාර්යාංශයේ කටයුතු ප්‍රවර්ධනය සඳහා වන අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා සාකච්ජාවක් පොලිස් කොමිෂන් සභාවේ සභාපති, නිලධාරින් සහ කාර්යාංශ නිලධාරින් සහභාගිත්වයෙන් 2017.1.11 වන දින පවත්වන ලදි. මෙම සංවර්ධන වැඩ සටහන දියත් කිරිම සඳහා සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද ඒජන්සියේ ආධාර වැඩ සටහන සහයෝගය ලබාදෙනු ඇත.

- **<u>සංචාරක පොලිසියේ කටයුතු වැඩි දියුණු කිරිම.</u>**

සංචාරක පොලිසියේ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා යොදාගත හැකි ක්‍රම සහ විධි මොනවාද යන්න සොයා බැලීම සඳහා පොලිස් කොමිෂන් සභාවේ සභාපති, හා එහි නිලධාරින් සහ සංචාරක පොලිස් කොට්ඨාශයේ අධ්‍යක්ෂකගේ සහභාගීත්වයෙන් සාකච්ජාවක් 2017.02.03 දින පවත්වනු ලැබිය. එහිදි දැනට පවතින ගැටළු සහ අවශ්‍යතාවයන් පිළිබඳව පුළුල් ලෙස සාකච්ජා කරන ලදි. නව සංචාරක පොලිස් කොට්ඨාශයක් ස්ථාපිත කිරිම, අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, වාහන හා අනෙකුත් අවශ්‍ය පහසුකම් පිළිබඳව ද සාකච්ජා කරන ලදි.

- මූලික විනය පරික්ෂණ පිළිබඳව සහකාර පොලිස් අධිකාරිවරුන් පුහුණු මූලික විනය පරික්ෂණ සම්බනධයෙන් කටයුතු කිරීමේදී විනය ගොනු කළමනාකරණ හැකියාව සහ විමර්ශන ධාරිතාවන් ශක්තිමත් කිරීමේ අරමුනින් ශ්‍රී ලංකා පොලිසියේ සහකාර පොලිස් අධිකාරිවරුන් සියළුදෙනා පුහුණු කිරීමට අරමුදල් සපයාගනුලැබීය. කොමිෂන් සභාවට ලැබෙන අභියාචනා සම්බන්ධ ක්‍රියාවලියේදී ඇතිවන ප්‍රමාදයන් සහ බාධාවන් ඉවත් කර ගැනීම සඳහා මෙම පුහුණුව ලබාදෙනු ලැබීය.

### 4.1.6 සංවර්ධන ආධාර කණ්ඩායම් සහභාගිත්වයෙන් පවත්වන ලද සාකච්ඡා

- ජාතික පොලිස් කොමිෂන් සභාවේ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා ලබාදිය හැකි තාක්ෂණික සහාය පිළිබඳව සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද ඒජන්සියේ නියෝජිත නිලධාරින්ගේ ද සහභාගීත්වයෙන් සාකච්ඡාවක් 2017.03.06 වන දින පවත්වන ලදි.
- විශේෂයෙන් මහජන පැමිණිලි විමර්ශනය සඳහා කාර්ය මණ්ඩල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා ලබාදිය යුතු පහසුකම් සොයා බැලීමේ අරමුණින් එක්සත් ජනපද ආධාර වැඩ සටහන, (USAID) අයි.ඕ.එම්(IOM),යූ.එන්.ඩී.පී.(UNDP) යන ආයතනවල නියෝජිතයින් සමඟ වටමේස සාකච්ඡාවක් පවත්වනු ලැබීය. කාර්ය මණ්ඩල සඳහා පුහුණු පාඨමාලා ලබාදීම, තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම, සහ අනෙකුත් අංශයන් සඳහා අවශ්‍ය උපකරණ පහසුකම් සපයා දීම පිළිබඳ අවධානය යොමු විය.

### 4.1.7 ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණ පිළිබඳ පුරවැසි විශ්වාසය වැඩිදියුණු කිරීම උදෙසා තොරතුරු හෙළිදරව් කිරීම.

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත ක්‍රියාත්මක වීම යටතේ තොරතුරු නිලධාරියෙකු සහ නම් කළ නිලධාරියෙකු ජාතික පොලිස් කොමිෂන්සභාව විසින් පත් කරනු ලැබීය.

**2017 වර්ෂයේ තොරතුරු දැනගැනීමේ පනත යටතේ පොලිස් කොමිෂන් සභාව විසින් ලබාදී ඇති තොරතුරු පිළිබඳ විස්තර පහත දැක්වේ.**

| | |
|---|---|
| ලැබී ඇති තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | - 50 |
| තොරතුරු ලබාදී ඇති සංඛ්‍යාව | - 31 |
| තොරතුරු ප්‍රතික්ෂේපිත සංඛ්‍යාව | - 14 |
| තොරතුරු ලබාදීමට කටයුතු කරමින් පවතින සංඛ්‍යාව | - 05 |

### 4.1.8. ව්‍යවස්ථාවේ විධි නියෝග පරිදි ව්‍යවස්ථාපිත වාර්තාකරණය

- **ව්‍යවස්ථා සභාව වෙත කාර්තුමය වාර්තාකරණය:**
  **ව්‍යවස්ථා සභාව මඟින් නියම කර ඇති පරිදි 2017 වර්ෂය සඳහා වාර්තා 04 ක් ලබාදී ඇත.**
- **පාර්ලිමේන්තුවට සහ ව්‍යවස්ථා සභාවට වාර්ෂික වාර්තාකරණය :-**

**ආයතනික අරමුනු සහ කාර්යාංශවල කාර්යසාධනය පදනම් කරගත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම.**

- **2017/2018 වර්ෂසඳහාවාර්ෂිකක්රියාකාරීසැලැස්මයාවත්කාලීනකිරීම.** :-
  යෝජිත කාර්යයන් සහ පුළුල් විධි නියෝග අනුව උප කමිටු 07 ක නිර්දේශය ද පදනම් කර ගනිමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කරනු ලැබීය. මෙය කාර්යාංශවල පැවරෙන රාජකාරී සහ භෞතික ඉලක්ක සහ නිශ්චිත කාලරාමු සහිතව සකස් කර ඇත.

## 4.1.9 ඉටු කර ඇති වෙනත් ක්‍රියාකාරකම්

- එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ මූලා ප්‍රතිපාදන මඟින් ජාතික පොලිස් කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ නිලධාරින්ගේ රාජකාරී කටයුතු සඳහා භාවිතා වන රැකියා විස්තර නැවත සකස් කිරීම එම අරමුදල විසින් පත් කරන ලද උපදේශකයෙකු (Consultant) විසින් සිදු කිරීම.

- නායකත්ව සංවර්ධනය, කණ්ඩායම් ගොඩනැඟීම හා යහපාලනය පිළිබඳව ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලයේ පළාත් කාර්යාලවල නිලධාරින් 74 දෙනෙකු සඳහා එක්සත් ජනපද ආධාර වැඩ සටහන (USAIDමඟින් 2017.05.26 – 27 දෙදින තුළ නේවාසික වැඩමුළුවක් වස්කඩුව සිට්‍රස් හෝටලයේදී පැවැත්විය.

- මෝදර සිට අවිස්සාවේල්ල දක්වා කැළණි ගඟ දෙපස රෝපණය කිරිමට පරිසර - ආරක්ෂණ පොලිස් කොට්ඨාශය සම්බන්ධ කරගෙන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් කුඹුක් පැළ 1000 ක් ලබාගෙන අදාල පොලිස් ස්ථාන වෙත භාර දීමට කටයුතු කිරීම.
- 2017.06.23 දින Asia Foundation, IOM, UNDP USAID යන ආයතනවල නියෝජිතයන් හා ජාතික පොලිස් කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් සමඟ පවත්වන ලද සාකච්ජාවන්ට අනුව පහත සඳහන් කරුණු පිළිබඳව සාකච්ජා පැවැත්වීය.
  i. ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල හා අරමුණු පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළුවක් පවත්වා මහජනතාවට වගකීමකින් හා විනිවිදභාවයකින් සහ කැපවීමකින් සේවය ලබාදීමට කටයුතු කිරීම.
  ii. වෘත්තීය මට්ටමින් සහ ඵලදායි අන්දමින් මහජන පැමිණිලි විමර්ශනය සඳහා එම අංශයේ ධාරිතා වර්ධනයට කටයුතු කිරීම.
  iii. ජාතික පොලිස් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය සහ සියළුම පළාත් කාර්යාල සම්බන්ධකර ගනිමින් තොරතුරු තාක්ෂණය පදනම් කරගත්වැඩසටහනක් සැකසීම හා එමඟින් මහජන පැමිණිලි ලබා ගැනීම සහ විමර්ශනය කිරිමේ කටයුතු සඳහා පළාත් කාර්යාල ශක්තිමත් කිරීම.
  iv. තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා පුහුණුවක් ලබා දීම.

ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා කාර්යාංශයේ දුර්වලතා හඳුනා ගැනීම හා වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් යෝජනා ලබා ගැනීමට විශ්ලේෂණයක් පැවැත්වීම සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවට ආධාර සැපයීම.

## 4.1.10. කැළණි ගඟ ඉවුරු දෙපස පරිසර දූෂණය වැළැක්වීම.

- කැළණි ගං ඉවුර දිගට ඇති ප්‍රදේශ පරිසර දූෂණයෙන් වැළැක්වීම සඳහා ගත යුතු පියවර පිළිබඳ දීර්ඝ සාකච්ඡාවක් මෝදර සිට අවිස්සාවේල්ල දක්වා ඇති පොලිස් කොට්ඨාශවල සහකාර පොලිස් අධිකාරිවරුන් සහ පරිසර ආරක්ෂණ ඒකකයේ අධ්‍යක්ෂවරුන් සහභාගීත්වයෙන් 2017.01.13 වන දින පවත්වන ලදි.
- මෙම ව්‍යාපෘතිය යටතේ ආරක්ෂා කර සංවර්ධනය කළ යුතු ස්ථාන මෙන්ම ඒ සඳහා යොදාගත යුතු ක්‍රමවේද මොනවාද යන්න හඳුනා ගැනීම සඳහා පොලිස් පරිසර කොට්ඨාශයේ අධ්‍යක්ෂකවරයාගේ අනුග්‍රහය යටතේ ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපති, ලේකම් ඇතුළු නිලධාරින් සහභාගී වූ නිරීක්ෂණ චාරිකාවක් 2017.02.19 දින මෝදර සිට හංවැල්ල දක්වා ක්‍රියාත්මක කරන ලදි. එහිදි බියගම පොලිසිය විසින් දියත් කළ පැළ සිටුවීමේ ව්‍යාපාරයකට ද එම නිලධාරින් සහභාගී වූහ. පරිසරය ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම විදහා පෙන්වන දැන්වීම් පුවරු ප්‍රදර්ශනයක් ද එහිදී පවත්වන ලදි.
- ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපති, නිලධාරින් සහ පොලිස් පරිසර කොට්ඨාශයේ නිලධාරින්ගේ සහභාගීත්වයෙන් විශේෂ සාකච්ඡාවක් 2017.03.20 වන දින පවත්වන ලදි.
- 2017.06.05 දිනට යෙදී තිබූ ලෝක පරිසර දිනය සැමරීම සඳහා කුඹුක් පැළ සිටුවීම මෝදර සිට අවිස්සාවේල්ල දක්වා ඒ ඒ පොලිස් ස්ථානයන් හරහා සිදු කරන ලදි. (කුඹුක් යනු ගං ඉවුරු ඛාදනය වළක්වන ශාකයකි)
- "කැළණි ගඟ ආශ්‍රිත පරිසරය අප ආරක්ෂා කළ යුත්තේ කෙසේද?" යන මාතෘකාව යටතේ මෝදර සිට අවිස්සාවේල්ල දක්වා වූ පාසල්වල පාසල් දරු දැරියන් සහභාගී කරවා ගනිමින් කථික, චිත්‍ර සහ රචනා තරඟ පැවැත්වීමට සැලසුම්කර ඇත. ත්‍යාග ප්‍රදානය කිරීම බස්නාහිර පළාත් සභාවේ අනුග්‍රහයෙන් සිදු කිරීමට සංවිධානය කරන ලදි.

## 4.1.11. පොලිස් කොමිෂන් සභාව විවිධ ක්ෂේත්‍ර 07 ක් ආවරණය වන පරිදි කමිටු පිහිටුවීම.

සභාපතිවරයාගේ යෝජනාවක් අනුව පොලිස් කොමිෂන් සභාවේ තෝරාගත් විෂය ක්ෂේත්‍ර 07 ක් යටතේ කමිටු 07 ක් 2017 ජුලි මාසයේ පිහිටුවා ඇති අතර ඒවා පිහිටුවීමේ අරමුණ වූයේ නීතිය හා සාමය සම්බන්ධ මතුව් ඇති බරපතල ගැටළුවලට හේතු සහ ඊට විසඳුම් සොයා බලා

ක්‍රියාත්මක කිරීමයි. කොමිෂන් සභාවේ එක් එක් සාමාජිකයින් මෙම කමිටුවල ප්‍රධානීන් ලෙස කටයුතු කරයි.

1. **රථවාහන පොලිසිය සහ සංචාරක පොලිස් පිළිබඳ කමිටුව -**
මෙම කමිටුවේ සභාපතිත්වය කොමිෂන් සභාවේ සාමාජික තිලක් කොල්ලුරේ මහතා දරන අතර කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් සහ අදාල පොලිස් කොට්ඨාශවල ප්‍රධානීහු සහ මීට අයත් වෙනත් පාර්ශවකරුවන් ඇතුලත් වේ. මෙමඟින් රථවාහන පොලිසිය මඟින් වැරදි කරන රියදුරන් හට අසාදු ලකුණු ලබාදීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරිණි.

2. **මත්ද්‍රව්‍ය උවදුර සහ ඒ හා සම්බන්ධිත අපරාධ සහ එහි බලපෑම පිළිබඳ කමිටුව -** මෙම කමිටුවේ සභාපතීත්වය කොමිෂන් සභාවේ සාමාජික ඇන්ටන් ජෙයනාදන් මහතා විසින් දරණ අතර අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය, ජාතික දුම්කොළ සහ මධ්‍යසාර අධිකාරිය යන අයාතනවල නියෝජිතයන් සහ මත්ද්‍රව්‍ය කාර්යාංශයේ පොලිස් ප්‍රධානීහු ඇතුලත් වේ. මේ යටතේ පාසැල් ළමුන් අතර මත් ද්‍රව්‍ය පැතිරීම වැළැක්වීමට ඒකාබද්ධ කාර්ය සාධනන බලකායන් සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් පිහිටුවීමට යෝජනා වී ඇත. සංචාරක පොලිස් කොට්ඨාශයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීම සහ සංචාරක පොලිස් ස්ථාන අළුතින් ආරම්භ කිරීමට අවධානය යොමු වී ඇත.

3. **සංවිධානත්මක අපරාධ පිළිබඳ කමිටුව**
මෙම කමිටුවේ සභාපතීත්වය කොමිෂන් සභාවේ සාමාජික ෆ්‍රෑන්ක් ද සිල්වා මහතා දරන අතර කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් සහ අදාල අංශවල ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරින් ඇතුලත් වේ. මෙමගින් සංවිධානානත්මක අපරාධ වැළැක්වීම විමර්ශනය කිරීම සහ නීතිමය කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමට අවශ්‍ය පුහුණුව සහ කාර්යසාධනය වැඩි දියුණු කිරිම සඳහා කටයුතු කිරීම සිදුවේ.

4. **පොලිස් සේවයේ කාන්තා සේවක සංඛ්‍යාව සහ ගෘහස්ත හිංසනය ඇතුළුව ළමයින් හා කාන්තාවන් හා සම්බන්ධ වැරදි පිළිබඳ කමිටුව -**
මේ යටතේ අන්තර්ජාලය ආශ්‍රිත අපරාධ නිවාරණයට අවධානය යොමු වී ඇත.එසේ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ පොලිස් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සහ පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමට , සංවේදී කිරීමට අවශය පුහුණු වැඩමුළු පැවැත්වීමට යෝජනා කර ඇත.
මෙම කමිටුවේ සභාපතිත්වය කොමිෂන් සභාවේ සාමාජිකාවක වන සාවිත්‍රි ඩී. විජේසේකර මහත්මිය දරනු ලබන අතර කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් හා ළමා හා කාන්තා කාර්යාංශයේ පොලිස් ප්‍රධානීන් ඇතුලත් වේ.

5. **පොලිස් ප්‍රතිසංස්කරණ, සංවිධාන විශ්ලේෂණය සහ UNDP, USAID සහ IOM අනුග්‍රහ යටතේ ආධාර වැඩසටහන් පිළිබඳ කමිටුව -**

මේ යටතේ පොලිස් සේවයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමේ අරමුණින් විද්වත් සහ මහජන අදහස් විමසීම ඇතුලු ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත.

කොමිෂන් සභාවේ සාමාජික මහාචාර්ය සිරි හෙට්ටිගේ මහතා මෙම කමිටුවේ සභාපතීත්වය දරණ අතර කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් සහ අදාල ආධාර ආයතනවලට නියෝජිතයින් ඇතුලත් වේ.

6. **මහජන පැමිණිලි විමර්ශන වැඩසටහන පිළිබඳ කමිටුව**

කොමිෂන් සභාවේ සභාපති පී.එච්. මනතුංග මහතා කමිටුවේ සභාපතීත්වය දරණ අතර මහජන පැමිණිලි විමර්ශන අංශයේ අධ්‍යක්ෂ ඇතුළු නිලධාරින් පළාත් අධ්‍යක්ෂවරුන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගෙන් සමන්විත වේ.

පරිගණක තාක්ෂණය උපයෝගී කරගනිමින් ප්‍රධාන කාර්යාලය සහ පළාත් කාර්යාල ජාලගත කිරීමේ වැඩසටහන් ආරම්භ කර ඇත.

7. **ආයතන කටයුතු විධිමත් කිරීමේ යන්ත්‍රණය පිළිබඳ කමිටුව**

කොමිෂන් සභාවේ සාමාජික වයි.එල්.එම්. සවාහිර් මහතා මෙහි සභාපතීත්වය දරණ අතර කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගෙන් සමන්විත වේ.

(පොලිස් ස්ථානාධිපතිවරුන් පත් කිරීම, මාරු කිරීම සහ රාජ්‍ය නිවේදිත නිලධාරින්ගේ කටයුතු මීට ඇතුලත් වේ. )

මෙම කමිටු මසකට දෙවරක් රැස්වී පොලිස් කොමිෂන් සභාවේ බල වපසරිය තුළ ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ කොමිෂන් සභාවට කිරීම.

## 4.2 මහජන පැමිණිලි විමර්ශන අංශය (PCID)


බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පිහිටුවා ඇති පොලිස් කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයට අමතරව සෑම පළාතකටම ආවරණය වන පරිදි මහජන පැමිණිලි භාර ගැනීම සඳහා කාර්යාල පිහිටුවා ඇත. අධ්‍යක්‍ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක මෙම කාර්යාලයට විමර්ශන නිලධාරියකු ද අනුයුක්ත කර ඇත.අදාළ පළාත් කාර්යාල වල ලිපිනයන් සහ දුරකථන අංක ඇමුණුම I මගින් දක්වා ඇත.

**2017.12.31** දිනට මහජන පැමිණිලි විමර්ශන අංශය වෙත ලැබී ඇති පැමිණිලි සහ විමර්ශන අවසන් කර ඇති පැමිණි
පිළිබඳ විස්තර වගුව **2**

| පළාත | ලද පැමිණිලි ගණන | පරීක්ෂණ අවසන් ගණන | විමර්ශන සිදු කෙරෙමින් පවතින ගණන | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 153 | 86 | 67 | 56 |
| බස්නාහිර | 416 | 119 | 297 | 29 |
| මධ්‍යම | 147 | 83 | 64 | 56 |
| වයඹ | 104 | 85 | 19 | 82 |
| දකුණ | 186 | 149 | 37 | 80 |
| උතුරු මැද | 87 | 53 | 34 | 61 |
| ඌව | 95 | 59 | 36 | 62 |
| සබරගමුව | 61 | 44 | 17 | 72 |
| උතුර | 57 | 31 | 26 | 54 |
| නැගෙනහිර | 160 | 47 | 113 | 29 |
| මුළු ගණන | 1466 | 756 | 710 | 52 |

2017 වර්ෂය තුළ ලැබී ඇති සමස්ථ පැමිණිලි සංඛ්‍යාව 1466 ක් වූ අතර ඉන් 756 ක් විමර්ශන අවසන් කර අදාල පාර්ශව වෙත සහන සලසා ඇත. නමුත් 710 ක විමර්ශන සිදුකෙරෙමින් පවති.

ප්‍රස්ථාරය **I**




ඉටු කර ඇති වෙනත් කටයුතු

- පොලිස් නිළධාරින්ට එරෙහිව ලද මහජන පැමිණිළි සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීමෙන් අනතුරුව පොලිස් නිළධාරින් 29 ට එරෙහිව විනය කටයුතු සිදු කර ඇත.

- මහජන පැමිණිළි විමර්ශන ක්‍රමවේදය සම්බන්ධව අංක 2047/22. හා 2017.11.28 දිනැති ගැසට් නිවේදනය නිකුත් කිරිම. (ඇමුණුම II)

- මහජන පැමිණිළි විමර්ශන අංශයට අනුයුක්තව සේවය කරනු ලබන විමර්ශන නිළධාරින් සඳහා උස්සවීම් ක්‍රමවේදයක් සැකසීමට කටයුතු කිරීම.

- UNDP මූල්‍ය අනුග්‍රහය යටතේ විමර්ශන නිළධාරින් ඇතුළු පොලිස් කොමිෂන් සභාවේ නිළධාරින් සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්විම

## 4.3. ආයතන හා විනය කටයුතු අංශය

සැම තරාතිරමකම පොලිස් නිලධාරින්ගේ බඳවා ගැනීම්, පත් කිරීම, උසස් කිරීම්,ස්ථාන මාරුකිරීම් සේවයේ ස්ථිර කිරීම් සේවා දිගු ලබාදීම, විනය පාලනය සහ විශ්‍රාම ගැන්වීම අදාල සියලු කරුණු පිළිබඳව ප්‍රතිපත්ති සකස් කිරීම මෙම අංශයට අදාල වන කාර්යභාරය වේ. රාජ්‍ය නිවේදිත නොවන නිලධාරීන් සම්බන්ධයෙන් පොලිස්පතිවරයාට බලය පවරා ඇති අතර අංශයේ සියළු කටයුතු කොමිෂන් සභාවේ මඟ පෙන්වීම සහ ප්‍රතිපත්ති තීරණ අනුව ක්‍රියාත්මක කරනු ලැබේ.

රාජ්‍ය නිවේදිත නිලධාරින්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීමේ විනය පාලන කටයුතු සෘජු ලෙස මෙම අංශය මඟින් ඉටු කරනු ලබන අතර එම කටයුතු පිළිබඳ තීරණ ලබා දීමට කොමිෂන් සභාවට උපකාර වේ. එසේම පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ පත් කිරිම් මෙන්ම සථාන මාරු කිරීම් ද සෘජුවම කොමිෂන් සභාවේ සෘජු අධීක්ෂණය යටතේ මෙම අංශය මඟින් සිදු කෙරේ.ඊට අතිරේකව සියළු පොලිස් නිලධාරින්ගෙන් පොලිසියට එරෙහි පැමිණිලි පිළිබඳව ද විමර්ශන කටයුතු මෙම අංශය මඟින් ඉටු කරනු ලබයි.

### 2017 වර්ෂයේ ඉටු කරනු ලැබූ කාර්යයන්

**වගුව 3**

| අනු අංකය | විස්තර | 1 කාර්තුව | 2 කාර්තුව | 3 කාර්තුව | 4 කාර්තුව |
|---|---|---|---|---|---|
| | <u>ආයතන කටයුතු</u> | | | | |
| 01 | **බඳවා ගැනීම් සහ උසස් කිරීම්:** | | | | |
| | i. ප්‍ර.පො.ප.වරු - ස.පො.අ. ලෙස උසස් කිරීම | 57 | -- | 02 | - |
| | ii. ස.පො.අ. - පො.අ. ලෙස උසස් කිරීම(පිරිමි) | 05 | 01 | 05 | 02 |
| | iii. ස.පො.අ. - පො.අ. ලෙස උසස් කිරීම(කාන්තා) | 08 | -- | -- | - |
| | iv. පො.අ.-ජ්‍යෝ.පො.ලෙස උසස් කිරීම | 03 | 01 | -- | 01 |
| | v. ජ්‍යෝ.පො.අ-නි.පො.ලෙස උසස් කිරීම | 08 | 01 | 12 | 26 |
| | vi. නි.පො. - ජ්‍යෝ.නි.පො. ලෙස උසස් කිරීම | 01 | -- | 03 | - |
| 02 | **උසස්වීම් සහ පෙරදාතම කිරීම සඳහා ලැබී ඇති අභියාචනා** | | | | |
| | **I. රාජ්‍ය නිවේදිත නිලධාරීන්** | 15 | 32 | 36 | - |
| | * ලැබී ඇති අභියාචනා සංඛ්‍යාව | -- | 10 | 05 | - |
| | * පොලිස්පති වෙතින් ලැබී ඇති වාර්තා සංඛ්‍යාව | | | | |
| | II. **රාජ්‍ය නිවේදිත නොවන නිලධාරීන්** | | | | |
| | *. ලැබී ඇති අභායාචනා සංඛ්‍යාව | 75 | 65 | 144 | 203 |
| | * පොලිස්පති වෙත යොමුකර ඇති සංඛ්‍යාව | 65 | 65 | 80 | 194 |
| | * වාර්තා ලැබීඇති සංඛ්‍යාව | 30 | 20 | 30 | 123 |
| | * අවසන් කර ඇති සංඛ්‍යාව | 08 | 08 | 05 | 79 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 03 | ස්ථාන මාරු | | | | |
| | I. රාජ්‍ය නිවේදිත නිලධාරීන් | | | | |
| | * ස.පො.අධිකාරි (පිරිමි) | 08 | 32 | 25 | 18 |
| | * ස.පො.අධිකාරි (කාන්තා) | 04 | -- | -- | - |
| | * පොලිස් අධිකාරි | 13 | 06 | 13 | 13 |
| | * ජ්‍යො.පො.අධිකාරි. | 09 | 02 | 05 | 07 |
| | * නියෝජ්‍ය පොලිස්පති | 05 | 11 | 12 | 04 |
| | * ජ්‍යො. නියෝජ්‍ය පොලිස්පති | -- | 03 | 03 | - |
| | II.රාජ්‍ය නිවේදිත නොවන නිලධාරීන් | | | | |
| | • පොලිස් ස්ථානාධිපතිවරු (පත් කිරීම හා ස්ථාන මාරු) | 58 | 91 | 136 | 92 |
| | • අභියාචනා මණ්ඩලය මගින් සිදු කරන ලද ස්ථාන මාරු සංඛ්‍යාව | 584 | -- | -- | - |
| 04 | විවිධ | | | | |
| | I. රාජ්‍ය නිවේදිත නිලධාරීන් | | | | |
| | • සේවය ස්ථිර කිරීම සහ පරිවාස කාලය දීර්ඝ කිරීම | 18 | 14 | 08 | 09 |
| | • විශ්‍රාම ගැන්වීම් | 10 | 05 | 13 | 13 |
| | • විදේශ නිවාඩු | 02 | 03 | | 05 |
| | • නැවත සේවයේ පිහිටුවීම | -- | 01 | 02 | 01 |
| | II. රාජ්‍ය නිවේදිත නොවන නිලධාරීන් | | | | |
| | • විශ්‍රාම ගැන්වීම් | 12 | -- | -- | - |
| | • අභියාචනා සම්බන්ධයෙන් පොලිස්පති වාර්තා ඉල්ලා ඇති සංඛ්‍යාව | 16 | -- | -- | - |
| | III. පොලීසියට විරුද්ධව පොලිස් නිලධාරීන්ගෙන් ලැබෙනපැමිණිලි | | | | |
| | • ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව | 47 | 17 | 25 | 52 |
| | • පොලිස්පති වෙත යොමුකර ඇති සංඛ්‍යාව | 47 | 17 | 25 | 51 |
| | • අවසන් කර ඇති සංඛ්‍යාව | 14 | 39 | -- | 09 |
| | • ක්‍රියා කෙරෙමින් පවතින සංඛ්‍යාව | -- | -- | 209 (2016 සිට) | - |
| 05 | විනය කටයුතු: | | | | |
| | රාජ්‍ය නිවේදිත | | | | |
| | • ලැබී ඇති විනය ගොණු සංඛ්‍යාව | 43 | 06 | 17 | 14 |
| | • විනය නියෝග නිකුත් කර ඇති සංඛ්‍යාව | 09 | 58 | 06 | 26 |
| | • ක්‍රියා කෙරෙමින් පවතින සංඛ්‍යාව | 192 | 156 | 151 | 137 |
| 06. | රාජ්‍ය නිවේදිත නොවන | | | | |
| | • ලැබී ඇති විනය ගොණු සංඛ්‍යාව | -- | 14 | 97 | 33 |
| | • අවසන් කර ඇති සංඛ්‍යාව | -- | 08 | 03 | 04 |
| | • ක්‍රියා කෙරෙමින් පවතින සංඛ්‍යාව | -- | 59 | 100 | 99 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 07. | දේශපාලනික වශයෙන් පීඩනයට ලක්වූ නිලධාරීන්ට සහන සැලසීම<br>• ලැබී ඇති සංඛ්‍යාව<br>• සහන සලසා ඇති ප්‍රමාණය (විශ්‍රාමික)<br>(2016.12.31 ට පෙර ලබාදීඇත. )<br><br>දේශපාලනික වශයෙන් අසාධාරණයට ලක්වූ පිරිසක් අධිකරණමය ක්‍රියා මාර්ග වලට යොමුවී ඇති නිසා ඉදිරි කටයුතු සඳහා නීති උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත. | 129<br>05 | 129<br>-- | 129<br>-- | 129<br>28 |
| 08. | **1 කාර්තුව** | **බඳවා ගැනීම් සහ උසස් කිරීම් පටිපාටි සැකසීම.**<br>I,ශ්‍රී ලංකා පොලිස් සේවයේ රාජ්‍ය නිවේදිත නොවන නිලධාරීන්<br><br>වර්ග 50 ක පමණ බඳවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටිවලඅවශ්‍ය සංශෝධනයන් සිදු කිරීමේ කටයුතු කෙරෙමින් පවතී.<br><br>ii.රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ බඳවා ගැනීමේ හා උසස් කිරීම් පටිපාටිය සංශෝධනය කර පොලිස්පති ගේ එකඟතාවය ලබා ගැනීමට යවා ඇත. | | | |
| | **2 කාර්තුව** | i.නි.පො.පති තනතුරට උසස් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේදී ලකුණු ලබා දීමේ ක්‍රමවේදය ඇතුලත් පටිපාටි සකස් කිරීම.<br><br>ii.2016 විවෘත තරඟ විභාගයෙන් ස.පො.අධි 20 ක් බඳවා ගැනීම සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය ඇතුලත් පටිපාටිය සකස් කිරීම<br><br>iii.සහායක සේවා වෘත්තීය වෛද්‍යන් හා වෛද්‍යවරුන්ගේ බඳවා ගැනීම් හා උසස් කිරීම් සම්බන්ධව කටයුතු කිරීම | | | |
| | **3 කාර්තුව** | i.රාජ්‍ය නිවේදිත නිලධාරින්ගේ සහ පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් 2017 අගෝ.01 දින ජාතික පොලිස් කොමිෂන් සභා චක්‍රලේඛයක් නිකුත් කිරීම<br>(අංක 2017/01)<br><br>ii.බඳවා ගැනීම් සහ උසස් කිරීම් පටිපාටි ගොනු 98 න් මේ වනවිට සකස් කෙරෙමින් පවතී.<br><br>iii.ශ්‍රේෂ්ඨාධිකරණයේ හා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියේ විභාග වන ආයතන හා විනය අංශයට අදාල නඩු පිළිබඳවනිරීක්ෂණ හා නිර්දේශ ලබාදීම. | | | |

| | | | | |
|---|---|---|---|---|
| | **4 වන කාර්තුව** | 01. බඳවා ගැනීමේ පටිපාටි 20 කට අදාලව කොමිෂන් පත්‍රිකා 04 සකසා ඉදිරිපත් කර ඇත.<br>02. නියෝජ්‍ය පොලිස්පති තනතුරට උසස් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේදී ලකුණු ලබාදීමේ ක්‍රමවේදය ඇතුලත් පටිපාටිය සකස් කිරීම.<br>03. 2016 විවෘත තරඟ විභාගයෙන් සහකාර පොලිස් අධිකාරීවරු 20 ක් බඳවා ගැනීම හා ලකුණු ලබාදිමේ ක්‍රමවේදය ඇතුලත් පටිපාටිය සකස් කිරීම.<br><br>04. ශ්‍රේෂ්ඨාධිකරණය හා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියේ නඩු අසමින් පවතින නඩු 18 ක් සඳහා නිර්දේශ හා නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.<br><br>05. පොලිස් නිලධාරීන් සක්‍රීය සේවා කාලය අර්ථ නිරූපනය කිරීම සම්බන්ධව නිරීක්ෂණ ලබාදීම<br><br>06. අසාධු සටහන් සම්බන්ධයෙන් නිර්දේශ හා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම<br><br>07. සහායක සේවා වෘත්තීය වෙදීන් හා වෛද්‍යවරුන්ගේ බඳවා ගැනීම හා උසස් කිරීම සම්බන්ධව කටයුතු කිරීම. | | |

## 4.4. ප්‍රතිපත්ති, නීති හා අභියාචනා අංශය

මෙම අංශය අධ්‍යක්ෂවරයෙකුගේ ප්‍රධානත්වයෙන් පවත්වාගෙන යන අතර සහායක අධ්‍යක්ෂවරුන් 4 දෙනෙක් අනුයුක්ත කර ඇත. මෙම අංශය මඟින් ඉටු කරන ලබන කාර්යයන් අතරට

**(i)** නව ප්‍රතිපත්ති හඳුන්වා දීම, ප්‍රතිපත්ති සම්පාදනය, පොලිස් සේවයේ දියුණුව සඳහා ඒවා ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කිරිම, මහජනයා හා පොලිසිය අතර සහසම්බන්ධතාවය ඇති කිරීම සඳහා ප්‍රතිපත්ති සැකසීම සහ පොලිස් නිලධාරීන්ට අදාළ ප්‍රශ්න සඳහා විසඳුම් ලබාදීම.

**(ii)** නෛතික විධි විධාන යටතේ බලය පැවරීම, නීතිරීති යාවත්කාලීන කිරීම ආදී කටයුතු කිරීම

**(ii)** නව පොලිස් කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද අවස්ථාව වන විට එකතු වී තිබූ අභියාචනා සහ සේවය අතහැරයාම සහ විනය නියෝගය සඳහා පොලිස්පතිවරුන්ගේ නිර්දේශවලට විරුද්ධව ලැබී ඇති අභියාචනා, සම්බන්ධව කටයුතු කිරීම පරිපාලන අභියාචනා විනිශ්චයාධිකරණය සහ පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාව යන ආයතනවලදී කොමිෂන් සභාව නියෝජනය කරමින් සහභාගී වීම, එසේම මූලික අයිතිවාසිකම් සහ රිට් ආඥා සඳහා නීතිපති උපදෙස් ලබා ගැනීමට කටයුතු කිරිම.

### ප්‍රතිපත්ති, නීති හා අභියාචනා අංශය 2017 වර්ෂයේ ඉටු කර ඇති කාර්යයන්

| | |
|---|---|
| 2017 වර්ෂය ආරම්භයේ තිබූ අවසන් නොවූ විනය ගොනු සංඛ්‍යාව | - 1288 |
| 2017 වර්ෂයේ අලුතින් ලැබුණු විනය අභියාචනා සංඛ්‍යාව | - 691 |
| 2017 වර්ෂය තුල තීරණ ලබාදුන් සංඛ්‍යාව (විනය) | - 593 |
| **නැවත සේවයේ පිහිටවූ, ප්‍රතික්ෂේප, පොලිස්පති වෙත යොමු කළ සංඛ්‍යාව | - 557 |

| | |
|---|---|
| 2017 වර්ෂය ආරම්භයේ තිබූ අවසන් නොවූ නැවත සේවයේ ගොනු සංඛ්‍යාව | - 1428 |
| 2017 වර්ෂයේ අලුතින් ලැබුණු නැවත සේවයේ පිහිටුවීම සම්බන්ධ අභියාචනා | - 969 |
| 2017 වර්ෂය තුල තීරණ ලබාදුන් සංඛ්‍යාව(නැවත සේවය) | - 625 |
| **නැවත සේවයේ පිහිටවූ, ප්‍රතික්ෂේප, පොලිස්පති වෙත යොමු කළ සංඛ්‍යාව | - 803 |
| 2017 වර්ෂය ආරම්භයේ තිබූ අවසන් නොවූ AAT ගොනු සංඛ්‍යාව | - 277 |
| 2017 වර්ෂයේ AAT ගොනු සංඛ්‍යාව | - 247 |
| 2017 වර්ෂයේ කටයුතු නිමකළ ගොනු සංඛ්‍යාව | - 55 |

නිරීක්ෂණ / ලිඛිත සංදේශ ලබාදුන් සංඛ්‍යාව - 218

2017 වර්ෂය ආරම්භයේ තිබූ අවසන් නොවූ ශ්‍රේෂ්ඨාධිකරණයේ/අභියාචනාධිකරණ

ගොනු සංඛ්‍යාව - 133

2017 වර්ෂය තුල ශ්‍රේෂ්ඨාධිකරණයේ/අභියාචනාධිකරණයේ ගොනුකර ඇති නඩු සංඛ්‍යාව -15

නිරීක්ෂණ ලබාදුන් සංඛ්‍යාව - 32

## 4.5 මූල්‍ය අංශය

සමාලෝචිත වර්ෂය තුල ජාතික පොලිස් කොමිෂන් සභාවේ නිසි ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය අරමුදල් ඒකාබද්ධ අරමුදලින් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය සමග නිරතුරුව සබඳතා පවත්වමින් මුදල් රෙගුලාසිවලට අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවේ ගිණුම් පවත්වාගෙන යාම සහ වෙනත් අදාළ ක්‍රියාකාරකම් ද මෙම අංශය මගින් ඉටු කරන ලදී. අරමුදල් කළමනාකරණය සහ වියදම් පාලනය, බඩු වට්ටෝරු අයිතම, කාර්යාල උපකරණ සහ මූලස්ථාන කාර්යාලය සහ පළාත් කාර්යාල 9 සඳහා ලිපි ද්‍රව්‍ය සැපයීම සිදු කරන ලද්දේ මෙම අංශය විසිනි. එමෙන්ම කොමිෂන් සභාවේ විවිධ සේවා ගණයන්හි නිලධාරීන් සඳහා වැටුප්, වේතන සහ වෙනත් ආකාරයේ ගෙවීම් ආදිය ද මෙම අංශය මගින් සිදු කළ යුතු විය. යෝජිත විදේශාධාර මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම ආරම්භ කිරීම තුලින් මෙම අංශය ශක්තිමත් කිරීමට කොමිෂන් සභාව බලාපොරොත්තු විය. 2017 වර්ෂයේ මූල්‍ය තත්ත්වය 4 වන වගුව මඟින් දක්වා ඇත.

**ජාතික පොලිස් කොමිෂන් සභාව -2017 වර්ෂයේ මූල්‍ය තත්ත්වය**

වගුව **4**

| වැය විෂය | විස්තරය | මුළු අනුමත ප්‍රතිපාදන | මුළු වියදම 2017.01.01 සිට 2017.12.31 දක්වා |
|---|---|---|---|
| | **පුනරාවර්තන වියදම්** | **97,196,000.00** | 94,722,953 |
| | **පුද්ගල පඩිනඩි** | | |
| 1001 | වැටුප් හා වේතන | **23,500,000.00** | 21,970,477 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | **300,000.00** | 271,468 |
| | **වෙනත් දීමනා** | | |
| 1003 | 11 ඒකාබද්ධ අරමුදල | **19,500,000.00** | 19,327,089 |
| 1003 | 21 විශේෂ නීති සේවා | **9,500,000.00** | 9,180,367 |
| | | **52,800,000.00** | **50,749,401** |
| | **ගමන් වියදම්** | | |
| 1101 | දේශීය | **200,000.00** | 184,498 |
| 1102 | විදේශීය | **50,000.00** | 43,830 |
| | **සැපයීම** | | |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | **1,370,000.00** | 1,362,140 |

| | | | |
|---|---|---|---|
| 1202 | ඉන්ධන | **1,400,000.00** | 1,398,805 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | **20,000.00** | 20,000 |
| | **නඩත්තු වියදම්** | | |
| 1301 | වාහන | **800,000.00** | 798,667 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | **180,000.00** | 168,831 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදි කිරීම් | **50,000.00** | 43,045 |
| | **සේවා** | | |
| 1401 | ප්‍රවාහන | **3,000,000.00** | 3,000,000 |
| 1402 | තැපැල් සහ සන්නිවේදන | **2,000,000.00** | 1,883,514 |
| 1403 | විදුලිය හා ජලය | **6,676,000.00** | 6,567,520 |
| 1404 | බදුකුලී සහ පළාත් පාලන ආයතන බදු | **22,300,000.00** | 22,194,916 |
| 1409 | වෙනත් | **5,880,000.00** | 5,847,437 |
| | **මාරු කිරීම්** | | |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොලී | **470,000.00** | 460,349 |
| | | **44,396,000.00** | **43,973,551** |
| | **මූලධන වියදම්** | **3,930,000.00** | **2,531,803** |
| | **පුනරුත්තාපන හා මූලධන වත්කම් වැඩිදියුණු කිරීම්** | | |
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | **80,000.00** | 0 |
| 2003 | වාහන | **150,000.00** | 0 |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | **1,400,000.00** | 1,343,478 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | **1,000,000.00** | 844,800 |
| | **දැනුම වර්ධනය** | | |
| 2401 | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | **200,000.00** | 200,000 |
| | **UNDP ව්‍යාපෘතිය** | | |
| 2509 | වෙනත් | **1,100,000.00** | 143,526 |
| | **මුළු එකතුව** | **101,126,000.00** | **97,254,756** |

ඇමුණුම I

**ජාතික පොලිස් කොමිෂන් සභාවේ පළාත් අධ්‍යක්ෂවරුන්ගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක**

| පළාත් නිලධාරීන්ගේ නම සහ කාර්යාලයීය ලිපිනය | නම | දුරකථන අංක |
|---|---|---|
| අධ්‍යක්ෂ (මහජන පැමිණිලි විමර්ශන) අංක 09,<br>බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය,<br>බෞද්ධාලෝක මාවත,<br>කොළඹ 07 | ඩබ්.ඒ.ඩී.පී. ලක්ෂ්මන් මහතා | 0115107725 |
| අධ්‍යක්ෂ (බස්නාහිර පළාත) අංක 09, බස්නාහිර පළාත් කාර්යාලය ජාතික පොලිස් කොමිෂන් සභාව<br>බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය,<br>බෞද්ධාලෝක මාවත,<br>කොළඹ 07 | ඒ.ජී. ධර්මදාස මහතා | 0115107730 |
| අධ්‍යක්ෂ (උතුරු පළාත ),උතුරු පළාත් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,<br>යාපනය. | ආචාර්ය කේ.ත්‍යාගරාජා | 0215107722 |
| අධ්‍යක්ෂ (මධ්‍යම පළාත), උතුරු මැද පළාත් කාර්යාලය,<br>ජාතික පොලිස් කෙමිෂන් සභාව,<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,<br>අනුරාධපුර | කේ.බී. හෙට්ටිආරච්චිමහතා | 0255107722 |
| අධ්‍යක්ෂ (දකුණු පළාත), දකුණු පළාත් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>පළමු මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>ගාල්ල. | පී.එච්.විමලරත්න මහතා | 0915107722 |
| අධ්‍යක්ෂ(මධ්‍යම පළාත), මධ්‍යම පළාත් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,<br>මහනුවර. | කේ. කැකුලන්දරමහතා | 0815107722 |
| අධ්‍යක්ෂ ( සබරගමුව පළාත), සබරගමුව පළාත් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නව නගරය,<br>රත්නපුර | පී. කොඩිතුවක්කු මහතා | 0455107722 |
| අධ්‍යක්ෂ (ඌව පළාත) ඌව පළාත් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය,<br>ඉංජිනේරු සේවා, පින්අරාව,<br>බදුල්ල. | ටී.එම්.ඩබ්. තෙන්නකෝන් මහතා | 0555107722 |
| අධ්‍යක්ෂ (වයඹ පළාත) වයඹ පළාත් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>කමර අංක 08, 3 වැනි මහල,<br>ජේෂකර්මාන්ත වෙළඳ සංකීර්ණය, අංක 4,මිහිඳු මාවත,<br>කුරුණෑගල. | ඩබ්.එම්. ජයවර්ධන මහතා | 0375107722 |
| අධ්‍යක්ෂ (නැගෙනහිර පළාත) නැගෙනහිර පළාත් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,<br>මන්මුනායි (උතුර),<br>මඩකලපුව. | ඒ. රවීන්ද්‍රන් මහතා | 0655107722 |